# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

### ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි දෙවන පරීක්ෂණය (බාහිර) - 2021

2024 අගෝස්තු

### මානවශාස්ත්‍ර පීඨය

## බෞද්ධ සංස්කෘතිය

**බෞද්ධ කලා, පුරාවස්තු හා භික්ෂු භික්ෂුණී සංස්ථා BUCU – 28214**

කොටස් දෙකෙන්ම ඇතුළත් වන සේ ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි.** **කාලය : පැය 03 යි.**

---

<u>පළමු කොටස</u>

01. පාලි විනය සාහිත්‍යයික වාර්තා ඇසුරෙන් බෞද්ධ සංඝාරාමයේ ආරම්භය හා විකාසය පිළිබඳ ප්‍රමාණවත් විවරණයක් සපයන්න.

02. පශ්චාත් මෞර්ය යුගයේ භාරතීය බෞද්ධ කලා සම්ප්‍රදායන්හි විකාසයේ පරිසමාප්තිය ගුප්ත යුගයෙන් ප්‍රකට වන අයුරු ඓතිහාසික නයින් ප්‍රකට කරන්න.

03. ශ්‍රී ලාංකේය බුද්ධ ප්‍රතිමා කලාවේ ඓතිහාසික විකාසය දක්වමින් එහි අනන්‍යතා ලක්ෂණ පිළිබඳ ප්‍රමාණවත් විස්තරයක් සපයන්න.

04. භාරතීය ස්තූපයේ දක්නට ලැබෙන නිර්මාණාත්මක විශේෂතා විමර්ශනය කරන්න.

05. කේන්ද්‍රීය ධර්ම සන්නිවේදන මාධ්‍යයක් වශයෙන් ශ්‍රී ලාංකේය බෞද්ධ චිත්‍ර කලාවට හිමිවන ස්ථානය පොළොන්නරුව බෞද්ධ චිත්‍ර ඇසුරෙන් අගය කරන්න.

<u>දෙවන කොටස</u>

06. පැවිද්ද අර්ථකථනය කරමින් මුල් යුගයේ බෞද්ධ භික්ෂු සමාජය නිරර්බුදව පැවතීමත් පසුව එය වෙනස්වීමත් කෙරෙහි බලපෑ හේතු යුක්තීන් විභාග කරන්න.

07. බෞද්ධ භික්ෂූන් වහන්සේගේ ආයති සංවරය හා ශාසනික චිරස්ථායීතාව එකසේ අර්ථවත් වීමෙහි ලා සංඝ කර්මයන්හි උපයෝගීතාව කෙබඳු දැයි පෙන්වා දෙන්න.

08. භික්ෂු සංස්ථාවේ සංවිධානමය සුරක්ෂිතතාව විෂයෙහි ආරාමික වත් ඉවහල්වන අයුරු සකාරණව පහදන්න.

09. ස්ත්‍රීත්වයේ අභිමානය සවිබල ගැන්වීමෙහි ලා බුදුරදුන් අනුගමනය කළ ප්‍රශස්ත පිළිවෙත භික්ෂුණී සංස්ථාවේ ප්‍රභවය හා වර්ධනය ඇසුරින් ප්‍රමාණ කරන්න.

10. භෞතික සම්පත් කළමනාකරණය පිළිබඳ ශාසනික පදනම ඇසුරින් ප්‍රකටවන සංස්ථාමය පසුබිම සනිදර්ශනව පැහැදිලි කරන්න.

*******************************